# සමුද්‍ර ජාතකය

තවද මෛත්‍රියෙන් මවාලූ රුවක් වැනිවූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපනන්ද නම් ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ඒ උපනන්ද නම් ස්ථවිරයන් වහ්නේ ඉතා ලොභිසේක. එක් ගෙයක සිවුරු හා එක් ගෙයක සැරයැටි හා එක්ගෙයක පාත්‍රය තබා ඒ ගෙවල්තුන මොගේ යයි කියා ලාභ ගන්නා සේක. මහාලෝභිසේක අනුන්ට ලොභ නොකරවයි බණ කියනසේක. තමන්වහන්සේ ගරුභාණ්ඩ ආදීය පිළිගන්නාසේක. යම් තෙනකට යන සේක්නම් ගැල් පටවාගෙණ යන්නාසේ නොයෙක් ගරුභාණ්ඩ පටවාගෙණ යනසේක. අනුන්ට ගරුභාන්ඩ නොගනුවයි බණ කියනසේකැයි යන කථාව භික්ෂූන් වහන්සේලා ධම්සභා මණ්ඩපයෙහි රැස්ව කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහ්නේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි වදාරා මෙපවත් අසා මහණෙනි තමන් මෙසේ කොට අනුන්ට අවවාදකිම යහපත් නොවෙන්නේවේදැයි නින්දා කොට වදාරා දැන්මතු නොවෙයි, මහණෙනි පෙරත් මූ මහලෝභීව සමුද්‍රයේ පැන් බොහෝව අන්න්ට බොන්නට නුපුරැයි අවවාද කළ කෙණෙක් වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි ආකාශයෙන් යන දියකාවෙක් කියන්නේ දැතිමෝරුන් කුඩ මැස්සන් ආදීවූ මත්ස්‍යයෙනි, මුදපැන් විතරක්සේ බොව, පැන් බොහෝ කොට වීවොත් තෝ නසියයි කියා ඇවිදිනේය. සමුද්‍රයේ වසන දේවතාවා කියන්නේ මේ කොයි පක්ෂීයෙක්ද?, සමුද්‍රයේ වසන මත්ස්‍යයන්ට පැන් නොබොන්නට කියා ගෙණ යන්නේයයි විචාළේය. දියකාවා කියන්නේ මම දියෙම් වසන්නාවූ දියකාවෙකි. සමුද්‍රයේ පැන් නැසෙති කිම් කීහ. එවිට දේවතාවා, කියන්නේ නිච්වූ සමුද්‍රකායකය, මේ සමුද්‍රයේ දිය එක්කෙනෙකුන් විසින් බී අඩුකොට ගත හැක්දැයි කියා ඌට භයංකාරවේශයක් දක්වා එතනින් පහකොට පුවයි වදාරා මේ සමුද්‍ර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සමුද්‍රකපුටා නම් උපනන්ද භික්ෂුහුය, සමුද්‍රදේවතාවා උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.